# කිතුනු නොවූ ආගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ සබඳකම් (DECLARATION ON THE RELATION OF THE CHURCH TO NON CHRISTIAN RELIGIONS - *NOSTRA AETATE*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නිර්දේශයඃ ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

ඩබ්. ආර්. එම්. තමෙල්

බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ මූලික අරමුණ වූයේ කතෝලික සභාව වර්තමාන ලෝකයට උචිත සේ ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය තීරණ ගැනීම ය. සමස්තයක් ලෙස සභාව කාලානුරූපී කිරීම ය. එහි ලා **නොකිතුනු ආගම් කෙරෙහි සභාවේ සබඳතාවය නම් වූ නිර්දේශයකි.**

ලෝකයේ ඇති සියලු ප්‍රධාන ආගම්වලට අයත් ජනයා එක ම පවුලකට අයත් බවත් ක්‍රිස්තියානි නොවන ආගමිකයන් ද ඇතුළු සියල්ලෝ ම එක ම දෙවියන්ගේ ජනතාවක් බැවින් රටක ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සාමය බඳු ප්‍රශ්නවල දී සියලු ම ආගම් එකමුතුව ක්‍රියා කළ යුතු බවත් අවධාරණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව නම් කිතුනු නොවන ආගම් කෙරෙහි සභාවේ දැක්ම කුමක් විය යුතු ද යන්න මෙන් ම එය කිතුනුවන්ගේ පැවැත්මට කොතෙක් දුරට උපකාරී වන්නේ ද යන්න විමසීම යි.

මුල් කිතුනු සභාව මගින් අන්‍ය ආගම්වලට විරුද්ධ වීමක් හෝ ඒවා හෙළා දැකීමක් දක්නට නොලැබුණි. එහෙත් පසුකාලීනව සභාව තුළ පරිපාලනමය බලය වැඩි වර්ධනය වීමත් සමඟ නොකිතුනු ආගම් හෙළා දැකීමත් ඒවා මිථ්‍යාදෘෂ්ටික ආගම් සේ සැලකීමත් නිසා ගැටුම්කාරී තත්ත්ව උද්ගත විය. මෙවන් පසුබිමක් තුළ කතෝලික සභාව නොකිතුනු ආගම් පිළිබඳ ධනාත්මක චින්තනයකට පරිණාමය වීම නොකිතුනු ආගම් කෙරෙහි සභාවේ සබඳතාවය නම් වූ නිර්දේශයෙන් ඉස්මතු වේ.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද වශයෙන් ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකිය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ විද්වතෙක් වන ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදඃ** දෙවන වතිකාන කතිකාවත, නොකිතුනු ආගම්, ධර්ම සිද්ධාන්ත